සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

# Provincial Department of Education - NWP

## තෙවන වාර පරීක්ෂණය - 9 ශ්‍රේණිය - 2019

## Third Term Test - Grade 9 - 2019

නම : ............................................ භූගෝල විද්‍යාව කාලය : පැය 02 යි.

වැදගත් :

- I කොටසේ ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.

## I කොටස

- **අංක 01 සිට 05 දක්වා ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර වරහන් තුළින් තෝරා හිස්තැන මත ලියන්න.**

(1) ආසියා මහාද්වීපය දකුණු අක්ෂාංශ $10^0$ සිට උතුරු අක්ෂාංශ ......................................... දක්වා ව්‍යාප්ත වේ.
( $70^0$, $80^0$, $90^0$)

(2) යුරල් ගංගාව .........................................ට ගලා බසී.
(කළු මුහුද, රතු මුහුද, කැස්පියන් මුහුද)

(3) අභ්‍යන්තර තැනිතලාවේ පිහිටි සමාන්තරව විහිදෙන හෙල්වැටියක් ලෙස ................................ කඳු දැක්විය හැක.
(රක්වාන, නමුණුකුල, සමනල)

(4) පුනර්ජනනීය බලශක්ති ප්‍රභේදයක් සඳහා නිදසුනක් වන්නේ, ............................................................ යි.
(ජල විදුලිය, තාප විදුලිය, සූර්යය ශක්තිය)

(5) ඩුබායි රාජ්‍යයේ ආර්ථිකයේ පදනම වන්නේ, ................................................................... නිෂ්පාදනයයි.
(විදුලි උපකරණ, ප්ලාස්ටික්, පෙට්‍රෝලියම්)

- **අංක 06 සිට 10 දක්වා ප්‍රශ්නවල දැක්වෙන ප්‍රකාශ නිවැරදි නම් ( 4 ) ලකුණ ද වැරදි නම් ( 5 ) ලකුණ ද ඉදිරියේ ඇති වරහන තුළ යොදන්න.**

(6) දකුණු ආසියාතික රටවල් අතර ඉහළම සාක්ෂරතා අනුපාතය ශ්‍රී ලංකාවෙන් වාර්තා වේ. (............)

(7) පකිස්ථානය ලෝකයේ විශාලතම වාර්මාර්ග පද්ධතියක් සහිත රටවල් අතරින් එකකි. (............)

(8) ඕසොන් ස්ථරය ආරක්ෂා කිරීමේ අරමුණින් මොන්ට්‍රියල් සම්මුතිය පිහිටුවා ඇත. (............)

(9) කිසියම් ස්ථානයක වායුගෝලයේ කෙටිකාලයක් තුළ ඇති වන තත්ත්වය දේශගුණය නම් වේ. (............)

(10) ශ්‍රී ලංකාවේ භෞතික භූ දර්ශනය මානුෂ ක්‍රියාකාරකම් කෙරෙහි තීරණාත්මක ලෙස බලපායි. (............)

I අංක 11 සිට 15 දක්වා ප්‍රශ්නවලට දී ඇති පිළිතුරු අතරින් නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

(11) 1:50,000 භූ ලක්ෂණ සිතියම්වල භූ විෂමතා ලක්ෂණ දක්වා ඇත්තේ කුමන ලක්ෂණයකින් ද?

(1) කඩ ඉරි (2) සමෝච්ඡ රේඛා (3) සමගැඹුරු රේඛා (4) කලු රේඛා

(12) දිස්ත්‍රික්ක අනුව මාසික කුටුම්භ ආදායම ඉහළ දිස්ත්‍රික්කය වන්නේ,

(1) ගම්පහ (2) කුරුණෑගල (3) කොළඹ (4) මහනුවර

(13) ශ්‍රී ලංකාවේ දක්නට ලැබෙන වගුරු බිමක් නොවන්නේ කුමක් ද?

(1) කලමැටිය (2) සුන්දරබාන් (3) ආනවිලුන්දාව (4) සෝමාවතිය

(14) ගොඩබිම දෙසට කා වැදුනු සාගරය හා සම්බන්ධ විවරය සාපේක්ෂ වශයෙන් විශාල සාගරික ප්‍රදේශ හඳුන්වන නම කුමක් ද?

(1) කලපුව (2) දඹය (3) බොක්ක (4) මෝය

(15) ජපානයේ පිහිටි පරිගණක හා පරිගණක උපාංග නිෂ්පාදන කර්මාන්තයක් වන්නේ,

(1) පැනසොනික් ය. (2) කැෂියෝ ය. (3) නිකෝන් ය. (4) පිකෝ ය.

I අංක 16 සිට 20 දක්වා ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර හිස්තැන් මත ලියන්න.

(16) ශ්‍රී ලංකාවේ කර්මාන්ත වැඩි වශයෙන් ව්‍යාප්ත වී ඇත්තේ .................................... පළාත තුළය.

(17) ශ්‍රී ලංකාවේ සමස්ත ජලවහන රටාව .............................................. රටාවක් පෙන්නුම් කරයි.

(18) යුරෝපය සහ ආසියාව භූගෝලීය වශයෙන් එක් භූ ස්කන්ධයක් ලෙස පිහිටා ඇති අතර එය ......................................ලෙස හැඳින්වේ.

(19) අසනි වැසි, සවස්කල වැසි, අකුණු කුණාටු වැසි ලෙස හඳුන්වන්නේ .................................................. වර්ෂාවයි.


(20) පරිසරය යහපත්ව පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය වන සාරවත් යහපුරුදු ........................................ ලෙස හැඳින්වේ.

(ලකුණු 2 x 20 = 40)

# II කොටස

- පළමු ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න 04කට පිළිතුරු සපයන්න.
- පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ.

(01) (අ) පහත දැක්වෙන ආසියාවේ සිතියම ඇසුරින් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.




(i) සිතියමෙහි A අක්ෂරයෙන් දැක්වෙන කඳු වැටිය නම් කරන්න. (ලකුණු 01)

(ii) B අක්ෂරයෙන් දැක්වෙන සානුව නම් කරන්න. (ලකුණු 01)


(iii) C අක්ෂරයෙන් දැක්වෙන ගංගාව නම් කරන්න. (ලකුණු 01)

(iv) D අක්ෂරයෙන් දැක්වෙන දූපත නම් කරන්න. (ලකුණු 01)

(v) දකුණු චීන මුහුද දැක්වෙන්නේ කුමන අක්ෂරයෙන් ද? (ලකුණු 01)

(vi) මලක්කා සමුද්‍ර සන්ධිය දැක්වෙන අක්ෂරය කුමක් ද? (ලකුණු 01)

(ආ) පහත දැක්වෙන ශ්‍රී ලංකා සිතියම ඇසුරින් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.




(i) A අක්ෂරයෙන් දැක්වෙන තුඩුව නම් කරන්න. (ලකුණු 01)

(ii) B අක්ෂරයෙන් දැක්වෙන දිස්ත්‍රික්කය අයත් භූවිෂමතා කලාපය නම් කරන්න. (ලකුණු 01)


(iii) C අක්ෂරයෙන් දැක්වෙන ශේෂ කන්ද කුමක් ද? (ලකුණු 01)

(iv) හලාවත කලපුව දැක්වෙන අක්ෂරය කුමක් ද? (ලකුණු 01)

(v) මන්නාරම් දූපත දැක්වෙන අක්ෂරය කුමක් ද? (ලකුණු 01)

(vi) සිතියමේ සේයා කර ඇති ප්‍රදේශයේ ව්‍යාප්ත වී ඇති වෘක්ෂලතා වර්ගය නම් කරන්න. (ලකුණු 01)

(ඉ) පහත දැක්වෙන රූප සටහන උපයෝගී කරගෙන ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.




1. A - B රේඛාවෙන් දැක්වෙන භූ ලක්ෂණය කුමක් ද?
2. C - D රේඛාවෙන් දැක්වෙන භූ ලක්ෂණය කුමක් ද?
3. E - f රේඛාවෙන් දැක්වෙන භූ ලක්ෂණය කුමක් ද?
4. G - H රේඛාවෙන් දැක්වෙන භූ ලක්ෂණය කුමක් ද?

(ලකුණු 04)

(02) (i) පහත සඳහන් සාගරවලට ගලා බසින ආසියානු ප්‍රදේශයේ ගංගා දෙක බැගින් නම් කරන්න. (ලකුණු 06)

| සාගරය | ගලා බසින ගංගා | |
|---|---|---|
| 1. ආක්ටික් සාගරය | 1. ....................................... | 2. ....................................... |
| 2. ඉන්දියන් සාගරය | 3. ....................................... | 4. ....................................... |
| 3. පැසිපික් සාගරය | 5. ....................................... | 6. ....................................... |

(ii) පහත සඳහන් ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර වරහන් තුළින් තෝරා ලියන්න. (ලකුණු 05)

(a) අඩුම වර්ෂාපතනයක් ලැබෙන කාන්තාරය .......................................................................

(b) වඩා උසින් ම පිහිටි සානුව ........................................................................

(c) ද. ආසියාවේ වැඩිම ජන සංඛ්‍යාවක් වාසය කරන රට ........................................................................

(d) ගැඹුරුම මිරිදිය විල ........................................................................

(e) ලොව උසින් වැඩිම කඳු මුදුන ........................................................................

(මොංගෝලියානු, ඉන්දියාව, ථාර්, එවරස්ට්, ටිබෙට්, බයිකල්, පාමීර්, චීනය, මාකාලු)

(03) (i) පහත A හා B රූප සටහන්වල දැක්වෙන මානව වර්ග දෙක නම් කර ඔවුන් ජීවත්වන රටවල් දෙක බැගින් නම් කරන්න. (ලකුණු 06)



A



B

මානව වර්ගය

1. ................................................ 2. ................................................

ජීවත්වන රටවල් 3. ................................................ 4. ................................................

5. ................................................ 6. ................................................

(ii) ආසියා මහාද්වීපය තුළ ගංගා නිම්න ආශ්‍රයෙන් බිහි වූ පැරණි ශිෂ්ටාචාර දෙකක් ලියන්න. (ලකුණු 02)

(iii) ආසියාවේ අසම ජන ව්‍යාප්තියට බලපා ඇති සාධක තුනක් සඳහන් කරන්න. (ලකුණු 03)

(04) (i) පහත සඳහන් වර්ෂාපතන ක්‍රම ශ්‍රී ලංකාවට ලැබෙන කාල සීමාව දක්වන්න. (ලකුණු 02)

(අ) නිරිත දිග මෝසම .............................................


(ආ) වාසුලි ....................................................................

(ii) ශ්‍රී ලංකාවේ උෂ්ණත්ව ව්‍යාප්තියේ වෙනස්වීම්වලට බලපාන සාධක දෙකක් ලියන්න. (ලකුණු 02)

(iii) (a) ශ්‍රී ලංකාවේ දේශගුණ කලාප දැක්වෙන පහත සිතියමේ A හා B වලින් දැක්වෙන දේශගුණ කලාප දෙක නම් කරන්න. (ලකුණු 02)

(b) C දේශගුණ කලාපය දැකිය හැකි ප්‍රදේශයක් සඳහන් කරන්න. (ලකුණු 01)

(c) D හා E වලින් දැක්වෙන දේශගුණ කලාපවල ව්‍යාප්තව ඇති වෘක්ෂලතා වර්ග පිළිවෙලින් නම් කර ඒවාහි දැකිය හැකි විශේෂ ලක්ෂණ එක බැගින් ලියන්න. (ලකුණු 04)




(05) (i) පරිසර පද්ධතියක් තුළ ඇති ප්‍රධාන සංරචක දෙක නම් කරන්න. (ලකුණු 02)

(ii) පාරිසරික තුලිතතාව බිඳ වැටීමට බලපාන හේතු A, B හා C රූප සටහන්වල දක්වා ඇත. ඒවා පිළිවෙලින් නම් කරන්න. (ලකුණු 03)

A


B


C


(iii) (a) ශ්‍රී ලංකාවේ පරිසර තුල්‍යතාවය රැකගැනීමට සම්මත කරගෙන ඇති පනත් දෙකක් ලියන්න. (ලකුණු 02)

(b) පරිසරයට අහිතකර පහත සඳහන් මානුෂ ක්‍රියාකාරකම්වල බලපෑම් 2 බැගින් දක්වන්න. (ලකුණු 04)

1. බලශක්ති හා පොසිල ඉන්ධන භාවිතය
2. යුධ අවි අත්හදා බැලීම.

(06) (i) සංවර්ධන මැනීම සඳහා යොදාගන්නා දර්ශක දෙකක් ලියන්න. (ලකුණු 02)

(ii) ශ්‍රී ලංකාවේ භූමි ප්‍රදේශයෙන් 3/4 පමණ වියළි කලාපයට අයත් වේ. එහෙත් වියළි කලාපයේ සංවර්ධන අඩාලවීමට බලපා ඇති කරුණු තුනක් ලියන්න. (ලකුණු 03)

(iii) (a) පහත රූප සටහන්වල දක්වා ඇත්තේ ජනාවාස වර්ග තුනකි. ඒවා A, B, C පිළිවෙලින් නම් කරන්න. (ලකුණු 03)

A



B



C



(b) ඉහත ජනාවාස තුනෙහි විශේෂ ලක්ෂණ එක බැගින් ලියන්න. (ලකුණු 03)

(07) (i) වෙරළබඩ ප්‍රදේශවල විවිධ භූ ලක්ෂණ දක්නට ලැබේ. ඒවා අතරින් පහත දැක්වෙන භූ ලක්ෂණ මොනවා දැයි හඳුන්වන්න.

1. තුඩුව 2. ද්‍රපත (ලකුණු 02)


(ii) 1:50,000 භූ ලක්ෂණ සිතියම්වල දැක්වෙන පහත සංකේත හඳුනාගෙන නම් කරන්න. (ලකුණු 04)

1. + රතු වර්ණ
2. △ කළු වර්ණ
3. ★ කළු වර්ණ
4. Y කළු වර්ණ

(iii) භූ ලක්ෂණ සිතියම්වල පෙන්නුම් කරන කරුණු කිහිපයක් පහත දක්වේ. ඒවා නිවැරදි හෝ වැරදි හෝ බව පිළිතුරු පත්‍රයේ ලියා දක්වන්න. (ලකුණු 05)

1. පරිපාලන මායිම් නිර්ණය කිරීමේ දී ගංගා කඳුවැටි යන භෞතික ලක්ෂණ පදනම් කරගෙන ඇත.
2. කෘෂිකාර්මික භූමි පරිභෝජනය බොහෝ විට භූ විෂමතාවය හා ජලවහනයට අනුකූලව ව්‍යාප්තව ඇත.
3. තැනිතලා ප්‍රදේශවලට වඩා කඳුකර ප්‍රදේශවල ජනාවාස පුළුල් ලෙස පැතිරී ඇත.
4. කඳුකර ප්‍රදේශවල වී වගාව ද මධ්‍යම උසින් යුතු කඳු බෑවුම් ප්‍රදේශවල තේ වගාව ද ව්‍යාප්තව ඇත.
5. තැනිතලා ප්‍රදේශවල මාර්ග රටාව ඍජුව විහිදෙන අතර කඳුකර ප්‍රදේශවල භූ විෂමතාවට අනුව විහිදුනු මාර්ග රටාවක් ඇත.

(08) සපයා ඇති උපකාරක පද ඇසුරින් ප්‍රහේලිකාව සම්පූර්ණ කරන්න.



පහළට

1. මධ්‍ය කඳුකරයේ පිහිටි කඳු වැටියකි.
2. ලෝකයේ ජනාධිකම රට
3. වර්ෂාව ලැබෙන ක්‍රමයකි.
5. දකුණු පලාතේ පිහිටි ගංගාවකි.
6. කටු පඳුරු හා ළඳු කැලෑවල වැවෙන ශාකයකි.
7. ආසියාවේ පිහිටි කඳුවැටියකි.
8. ජලයෙන් ඉහලට එසවුණු මුල්

හරහට

4. භූමියේ උස
5. කාලගුණික අංගයකි.
7. සත්ව පාලනය කරන ප්‍රදේශයකි.
11. ආසියාවේ පිහිටි ද්‍රපතකි.

Anwer

සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

## තෙවන වාර පරීක්ෂණය - 9 ශ්‍රේණිය - 2019
## Third Term Test - Grade 9 - 2019

### භූගෝල විද්‍යාව - පිළිතුරු පත්‍රය

### I කොටස

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 01. | $80^0$ | 06. | 5 | 11. | සමෝච්ච රේඛා | 16. | බස්නාහිර |
| 02. | කැෂ්පියන් | 07. | 4 | 12. | කොළඹ | 17. | අරීය |
| 03. | රක්වාන | 08. | 4 | 13. | සුන්දරබාන් | 18. | යුරේෂියාව |
| 04. | සූර්යය ශක්තිය | 09. | 5 | 14. | බොක්ක | 19. | සංවහන |
| 05. | පෙට්‍රෝලියම් | 10. | 4 | 15. | පීකෝ | 20. | පරිසර ආචාර ධර්ම |

(ලකුණු 2 x 20 = 40)

### II කොටස

01. අ. (i) හිමාලය
(ii) ඉරාන
(iii) හොවැංහෝ
(iv) හොකයිඩෝ
(iv) k
(v) o

ආ. (i) පේදුරු තුඩුව
(ii) මධ්‍යම කඳුකරය
(iii) රිටිගල
(iv) m
(v) q
(vi) කටු පඳුරු හා ළඳු කැලෑ

ඉ. (i) කපොල්ල
(ii) නෙරුව
(iii) නිම්නය
(iv) කොත් කන්ද

02. අ. (i) අක්ටික් සාගරය - ඕබි, යෙනිසි, ලීනා
ඉන්දියන් සාගරය - ගංගා, ඉන්දු, බ්‍රහ්ම පුත්‍ර, මිකොං, ඉරවඩි, සැල්වීනි
පැසිපික් - අමූර්, හොවැංහෝ, යැංසි (ලකුණු 06)
(ii) a. ගෝබි කාන්තාරය b. ටිබෙට් සානුව c. ඉන්දියාව d. බයිකල් විල c. එවරස්ට් (ලකුණු 05)

03. අ. (i) A - කොකසයිඩ්
ජීවත්වන රට - ඉන්දියාව, ඇෆ්ගනිස්ථානය, පාකිස්ථානය, ශ්‍රී ලංකාව, අරාබි රටවල්
B - මොන්ගොලොයිඩ්
ජීවත්වන රට - චීනය, ජපානය, මලයාසියාව, කොරියාව, සිංගපූරුව (ලකුණු 04)
(ii) (a) හොවැංහෝ, සින්දු, යුප්‍රටීස්, ටයිග්‍රිස් (ලකුණු 02)
(b) ක්‍රමවත් නගර නිර්මාණ, කෘෂිකර්මය, ගොඩනැගිලි හා ප්‍රතිමා නිර්මාණය, කලාත්මක භාණ්ඩ නිෂ්පාදනය (ලකුණු 02)
(iii) භූ විෂමතාවය, දේශගුණය, ජලවහනය, පස, තාක්ෂණය හා සන්නිවේදනයේ දියුණුව, මානව ශිෂ්ඨාචාර පැවතීම. (ලකුණු 03)

04. (i) අ - මැයි සිට සැප්තැම්බර් දක්වා ආ - නොවැම්බර් - දෙසැම්බර් (ලකුණු 02)
(ii) ඉන්දියානු උප මහාද්වීපයට ආසන්නව පිහිටීම./ උන්නතාංශය (භූමියේ උස)
මුහුදේ සිට ඇති දුර, වෙනත් වන සුළං රටාව
(iii) (a) A - කඳුකර තෙත් කලාපය B - කඳුකර වියළි කලාපය (ලකුණු 02)
(b) C - හම්බන්තොට දිස්ත්‍රික්කය ආශ්‍රිත ප්‍රදේශය හෝ මන්නාරම් දිස්ත්‍රික්කය ආශ්‍රිත ප්‍රදේශය (ලකුණු 01)

(c)

| අක්ෂරය | වනාන්තර වර්ගය | විශේෂ ලක්ෂණ |
|---|---|---|
| D | පහතරට වියළි මිශ්‍ර සදාහරිත වනාන්තර | ගස්වල උස 20m - 30m පමණ වේ.<br>වර්ෂා කාලයේ දී ශාක වැඩේ.<br>වියළි කාලයේ දී ශාකවල වර්ධන වේගය අඩුය.<br>2m - 3m උස පඳුරු ද දැකිය හැක.<br>ඝන වනාන්තර නැත.<br>තැනින් තැන උසගස් ඇත.<br>තද අරටු සහිතයි.<br>වනාන්තර ලා කොල පැහැතිය. |
| E | පහතරට තෙත් කලාපීය වනාන්තර | ශාක 30m - 40m උසය<br>වියන් ස්තර කිහිපයක් පවතී.<br>වනාන්තර අවුරුද්ද මුලුල්ලේම වැඩෙමින් පවතී.<br>තද කොළ පැහැති ය.<br>ශාක ඝනව වැඩේ.<br>යටිරෝපනය බහුලයි.<br>ජෛව විවිධත්වය ඉහළයි.<br>ශාක මුදුන් එකිනෙකට හා වී ඇත. |

(ලකුණු 04)

05. (i) ජීවී සංරචක, අජීවී සංරචක (ලකුණු 02)

(ii) A - වන විනාශය B - කෘෂි රසායනික භාවිතය C - කැලි කසල දැමීම (ලකුණු 03)

(iii) (a) වෙරළ සංරක්ෂණ පනත/ජාතික උරුම වන භූමි පනත (ලකුණු 02)

(b) (i) වායු දූෂණ, පරිසර උෂ්ණත්වය ඉහළ යාම. (ලකුණු 02)

(ii) වායුගෝලය දූෂණය වීම, සාගර ජල දූෂණ වැනි නිවැරදි පිළිතුරුවලට ලකුණු ලබා දීම. (ලකුණු 04)

06. (i) ඒක ශීර්ෂ ආදායම/ ළදරු මරණ අනුපාතිකය/ උපතේ දී ආයු අපේක්ෂාව/ සාක්ෂරතාවය අතුරින් දෙකට (ලකුණු 02)

(ii) අඩු පහසුකම් (භෞතික හා යටිතල), ජල හිඟය, කර්මාන්ත ව්‍යාප්ත නොවීම. අන්තගාමී දේශගුණ ලක්ෂණ (වියළි දේශගුණ) වැනි කරුණු 3කට (ලකුණු 03)

(iii) (a) A - ග්‍රාමීය ජනාවාස B - ගැමි නාගරික ජනාවාස C - නාගරික ජනාවාස (ලකුණු 03)

(b) A - ප්‍රාථමික ආර්ථික කටයුතු වැඩිය. භෞතික පරිසරය විශාලයි/ කෘෂි හා ධීවර කර්මාන්තය මත පදනම් වූ කර්මාන්ත පැවැතීම ජනගහනය අඩුවීම.

B - ග්‍රාමීය හා නාගරික ලක්ෂණ මිශ්‍රව ඇත.

C - සීමිත බිම් ප්‍රමාණයක අධික ජනසංඛ්‍යාවක් ඇත. අධික ජන ඝනත්වය, භෞතික පරිසරය සීමිතයි. වැනි කරුණු 3කට (ලකුණු 03)

07. (i) තුඩුව - සාගරය දෙසට නෙරුගිය පටු ගොඩබිම් කොටස

දූපත - මුහුදෙන් වට ඇති කුඩා ගොඩබිම් ප්‍රදේශය

(ii) 1. රෝහල 2. බෞද්ධ සිද්ධස්ථානය 3. පොලිසිය 4. මුස්ලිම් පල්ලිය

(iii) 4 නිවැරදියි 2. 4 නිවැරදියි 3. 5 වැරදියි 4. 5 වැරදියි 5. 4 වැරදියි

08.

| පහළට | හරහට |
|---|---|
| 1. සමනල | 4. උන්නතාංශය |
| 2. විනය | 5. වර්ෂාපතනය |
| 3. සංවහන | 7. අබේවේල |
| 5. වළවේ | 11. තායිවානය |
| 6. පතොක් | |
| 7. අල්තායි | |
| 8. වායුධර | |